# සීතාවක පුරාණය



සීතාවක ටිකිරි බණ්ඩාර රාජසිංහයන් ගණේගොඩ දෙවියන් නමින් දේවකායට ඇතුළත්ව ඇති බව ප්‍රදේශයේ ප්‍රචලිත ඇදහිල්ලකි. ගණේගොඩ නමින් ගම් කීපයක්ම ප්‍රදේශය වටා ඇත. සැවුල් සන්දේශයේ සඳහන් වන ගණේගොඩ කුරුවිටත් සපර පුරයත් අතර පිහිටා ඇත. වරක් භුවනෙකබාහු සීතාවක ආක්‍රමණය කළවිට මායාදුන්නේ බටුහේනට ගොස් මඟහැර සිටි බව චූල වංශයේ සඳහන් වේ. ඒ බටුහේනත් ගණේගොඩත් එකක් බව සිතිය හැකය. ගැටහැත්තේ කඩවතින් එහා ඉද්දමල්ගොඩට නුදුරුව ගණේගොඩක් ඇත. මහනුවර දිස්ත්‍රික්කයේ පිහටි ගණේගොඩ දේවාලයේ රාජසිංහ රජු පිළිබඳ විශ්වාසය බෙහෙවින් පවතී. ටිකිරි බණ්ඩාර උපන්නේත් මායාදුන්නේ මිය ගියේත් ගණේගොඩකදී බව ජනප්‍රවාද වලින් හෙළිවේ. කළුබුල්ල, මැදගොඩ, පන්තිනි දේවාල වල මුල්තැනට එන්නේ ගණේගොඩ දෙවියන්ය.

"පස්වාන් දහසක් ඉරහඳ පවතිනා තේකට කප්පාන්තරේකට සිද්ධ ගණේගොඩ දෙවි හාමුදුරුවන් වහන්සෟ" යනුවෙන් දේව යාතිකාව ආරම්භ වේ. පන්තිනි දෙවි ඇතුළු වෙනත් දෙවිවරුන් අමතන්නේ ඊට පසුවයි. දේවාල උත්සව වලදී මුල්ම පහණ දල්වන්නේත මුල්ම ගොටුව පුදන්නේත ගණේගොඩ දෙවිඳුන්ටයි.

කබුළුමුල්ල දේවාලයේ මඩු උත්සව අවස්ථා වලදී රතු පාට රජ ඇඳුමින් සැරසුණු රාජසිංහ රජු ගේ කඩුවද ගෙන කඩුපාලිය නැටීම සිරිතකැයි ටිකිරි බණ්ඩාර කපු රාළහාමි පැවසීය.  ගණේගොඩ දෙවි උපත එම යාදින්නේත් එම පුවතේත් විස්තර වේ.


| | |
|---|---|
| පුවතක් මෙලොව | වැඩ |
| උදෙසා දෙවි බලය | දිඩ |
| දෙවතොත් මෙමට | ඉඩ |
| කියම් පුවතක් දෙවි ගණේ | ගොඩ |

| | |
|---|---|
| පවර පසිඳු සිරිලක් දිව සසො | බන |
| කවර මහිස තුරඟන් සැදි වෙන | වෙන |
| සමර ගිරා ලිහිණින් පුර | වියන |
| නුවර ඒ ජයවර්දන කෝට්ටෙයි | ය |

ජවර්දන පුර බුවනෙකබාහු රජ බිසවට යක්ෂ දෝෂයක් වැලඳුණි. එක් සහ නමක් ලවා පිරිත් කියවා, පිරිත්  හුයක් බැඳ ආරක්ෂා කළවිට බිසව නිරුපද්‍රිත වුවාය.

යකුගොසින් සීතාවක පුර මායාදුනු රජුගේ බිසවට ආවේශ විය.

| | |
|---|---|
| ගොසින් ඒ සීතාවක් පුර | මෙරගේ |
| නම්නි එමායා දුන්නේ | රජුගේ |
| පෙමින් බොලඳ රූසිරු බිසවුන් | නේ |
| ගොසින් එතැන වැසුනයි තද | උරනේ |



ශාස්ත්‍රවේදී

නා. ලි. සාර්ලිස් අමරසිරි

| | |
|---|---|
| කය බීතව ගිනියම් ඔල්වා | දත් |
| ලැය තද ගිනියම් පිස්සු විකාර | ත් |
| බිය වැද වෙවුලුම් කැසි ඔක්කාර | ත් |
| විය තද මේ ලෙඩ ඒ  බිසවුන් | ඩත් |

පෙරදී සඳහන් කළ භික්ෂුවම ගෙන්වා පිරිත් හුයක් වට කොට බැඳ යකු සලිත කළ විට  යක්ෂා වේශයෙන් බිසව මෙසේ කීවාය.

| | |
|---|---|
| මින් මතු සඟයින් දුටු තැන වෙසෙ | සම් |
| බන්ධන බල සඟ පෙළ මුල වන | සම් |
| සුන්කර දුටුතැන කුලල් කඩා | ලම් |
| මන් මේ ලෙස දුටු දුටු තැන උප | දිම් |

යකු ඊට පසු බිසවගේ කුසතුළ පිළිසිඳ මව්කුසින් බිහිව සෙළොස් වියට පැමිණි සඳ පිය රජුගෙන් රජකම ඉල්ලූ බවත් ලාබාල වයසේ බැවින් රජකම පැවරීම ප්‍රතික්ෂේප වූ බවත් ටිකිරි බණ්ඩාර පියා මරා රජකම ගත් බවත් කියැවේ. (එහෙත් ක්‍රි.ව. 1581 දී රාජසිංහ රජකමට පත්වන විට ලාබාල වයසේ සිටි බවක් නොපෙනේ එම විට ඔහුගේ වයස අවුරුදු 35ක් වත් විය යුතුය.) ලාබාල කුමරුගේ යුධ ශිල්ප දස්කම් බලන්නට සැඟවී සිටියදී අහම්බෙන් කුමරුගේ කඩු පහරකට ලක්වී රජු මිය ගිය බවට ප්‍රචලිත කථාවද පිළිගැනීමට සාධක නැති බොරුවකි.

භික්ෂුන් ගෙන්වා පියා මැරූ පව ගෙවන්නට හැකිදැයි විමසූ විට ඊට සුදුසු පිළිතුරු නොලැබුණු බව කියයි. වයෝ වෘධ භික්ෂුන් බැණ නොනැගී සිටි බවත් සාමණේර භික්ෂුවක් පිළිතුරු දුන් බවත් කියැවේ.

| | |
|---|---|
| විසාර දෝ බණ දහම් | දෙසාලා |
| නසාගන්ට බැරි පවකි | අසාලා |
| රොසා වෙමින් රජු එවිට | කිපීලා |
| ගසා සඟුන් දැමු කුලල | කඩාලා |

(මෙය සිදුවුයේ ක්‍රි.ව. 1581න් විය හැකිද?)

| | |
|---|---|
| කාව්ය සේකර බමුණෝ  පවස | ති |
| බ්‍රාඩිය යන තෙද බල දෙවියෙක් | ඇති |
| ඒ දෙවි මෙපුරට වැඩ මෙව්වොත් | නිති |
| මේ පිය මැරු අකුසලය කොහේ | නැති |

(ලක්වැසි දන බ්‍රාඩිය හඳුනාගෙන සිටියේ මීට පෙර බවට සාධක පෙන්වාදී ඇත.)

## ගණේගොඩ දෙයියෝ

ඉන්දියාවෙන් ගල් වඩුවන් ගෙන්වා ගල්මාලිගාවක් කරන්නට ඇරඹුනේ ඉන් පසුව බවත් ගල්වඩුවන් ලවා පේකඩ කප්පවා පිටින් ලෑලි ගෝනැස් ලා මාලිගා කරන්නට පටන් ගත් බවත් මෙහි විස්තර වන නමුත් රාජසිංහයන්ගේ මුල් කාලයේදීම බිරාඩි දෙවොල නිමවී පැවතුන බවට සැවුල්

***<u>ඊට පසුද පිරිත් දෙසීමේ මුවාවෙන් රජුට විරුද්ධව කුමන්ත්‍රණකාරී ක්‍රියා පිළිවෙතක් දියත් වී තිබුණු බැවින් පිරිත් දෙසීම රජුට වහ කදුරු මෙන් වූ බව පෙනේ.</u>***

සංදේශය සාක්ෂි දරයි. කෙසේ හෝ වේවා මායාදුන්නේ ගේ මරණයෙන් පසු රාජසිංහයන් භික්ෂුන් වහන්සේලාගෙන් පලි ගැනීමට පටන්ගත් බව පෙනේ.

මාපිටිගම (වැද්දවල) බොරුක් සෙවනකදී සඟුන් රැස්ව පිරිත් කියා ගණේගොඩ දෙවි බන්ධනය කිරීමට සුදනම් වූ විට රජු එහිගොස් උන් වහන්සේලා මරවා ඔලුගෙඩි එකට ගටා ගොඩ ගැසූ බවත් ගණේගොඩ විස්තරයේ කියයි.

| | |
|---|---|
| දවස දෙවේලේ පිරිත් දෙසී | මෙන් |
| සරොස වෙලා මහණුන් හට දෙවි | යන් |

| | |
|---|---|
| සවස එබෝතුර ලෙලවා සත | තින් |
| දවසක් බන්ධන කරන්නට සද | මින් |

| | |
|---|---|
| ගොසින් එමාපිටිගම පියසෙහි | යන |
| සවින් ම බුජ බල පෑවයි සිය | තින |
| ගිමන් අරින කල බෝතුර සෙව | නින |
| රොසින් ගොසින් සඟ සැට නම | මරමින |

අටුළුගම දීද මෙබඳු බෝ රුප්පාවකට වැද සංඝ සංහාරයක යෙදුනු බව කියවේ. (සමහර විට භික්ෂූන් වහන්සේ රැස්ව රජුට විරුද්ධව කුමන්ත්‍රණය කරන්නට ඇත. රජු අල්ලා මැරවීමට සුදනමක් තිබුනා විය හැකිය. මෙය දැනගත් රජතුමා එතැනට ගොස් සංඝ සංහාරයක යෙදුනා විය හැකියි.)

දේව රජසිහ නමින් මෙලක තුළ රජ පැමිණ සත් වසරකට පසුව පළමු කළ පිං බලෙන් නොමල කය එර්දියෙන් දේව කය මැවුණු බවත් ගණේගොඩ දෙවි නමින් මෙලක තෙද පාන්නට පටන් ගත්තේ ඊට පසුව බවත් ගණේගොඩ යාදින්නේ සඳහන් වේ.

අටුළුගම දේවාල කන්දේ මං ගෙදර කෝවිල පෙනෙන තෙක් මානයේ නුගාමින්නේන් වෙලේ නුග සෙවනක නොපෙනී සිට - මම ගණේගොඩ දෙවි" කියා මග යන එන අයට තර්ජනය කළ බවද කියවේ.

| | |
|---|---|
| ගොසින් අටුළුගම බෝ රුප්පේ | වැස |
| දනන් මෙමග යන්නන් අල්ලා | රොස |
| මෙනම් ගණේගොඩ දෙවිඳු මමයි | යස |
| ඇසින් නොදැක මේලෙස පවසති | බස |

| | |
|---|---|
| එයිත් ගාම නුගාමින්නේ | වෙල |
| මහත් එනුග තුරයේ වැඩ උන් | කල |

| | |
|---|---|
| පෙනුත් ඒ මං ගෙදරයි යන | කෝවිල |
| තවත් එතැන පුද පඩුරු ලැබූ | කල |

පසු කලෙක වණිග කුල අබේසිංහ සෙබළ පරම්පරා වේ දෙවි ගැති වරයෙකුට සිදු වූ අසාධාරණයක් ඔහුගේ සහෝදර දෙවි ගැතියෙකු විසින් දෙවියන්ට සැළ කළ විට ඔහුට පිහිට වී ලොවට බල පෑ අන්දමට මෙම පුවතේ අපැහැදිලි ලෙස කියවේ.

කෙසේ වෙතත් මෙම විස්තර අනුව පිරිත් කියා යකු බන්ධනය කිරීමට වරින් වර භික්ෂුන් වහන්සේලා ගත් ක්‍රියා මාර්ගය භික්ෂුන් කෙරෙහි රජුගේ වෛරය පහළ වීමට හේතු වූ බව පෙනේ. ඊට පසුද පිරිත් දෙසීමේ මුවාවෙන් රජුට විරුද්ධව කුමන්ත්‍රණකාරී ක්‍රියා පිළිවෙතක් දියත් වී තිබුණු බැවින් පිරිත් දෙසීම රජුට වහ කදුරු මෙන් වූ බව පෙනේ. අදද කබුළුමුල්ල ප්‍රදේශයේ භික්ෂුන් වහන්සේලා ලවා පිරිත් කියවීම ගමට හානිදායක බවට මිනිසුන් අතර මුල් බැසගත් විශ්වාසයකි. යක්ෂයෙකු මිනිසෙකු වී සිට පසුව දෙවියෙකු වූ බවත් ප්‍රදේශයේ මිනිසුන් ඔහුට අද දක්වාත් ගරු සැලකිලි දක්වන බවත් සත්‍යයකි.







නොවැළැක්විය හැකි හේතු මත ආචාර්ය පාලිත ගනේවත්ත ලියන පැතිකඩ ලිපි මාලාවේ ඩී බී ගේ සාහිත්‍ය සේවාව - 3 ලිපිය මෙවර පළ නොවන බව කරුණාවෙන් සළකන්න එය මීළඟ කළාපයේ සිට සුපුරුදු පරිදි පළවනු ඇත